## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවිවන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2023

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, පුහුණු කිරීමේ ශ්‍රේණියේ අඩවිවන නිලධාරි තනතුරුවලට බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහාවන විභාගය 2024 වර්ෂයේ ජුනි මසදී කොළඹ දී පැවැත්වීමට නියමිතය.

1. වැටුප් ක්‍රමය ඃ
   - පුහුණු කිරීමේ ශ්‍රේණිය ඃ MN 01 රා.ප.ච. අංක 03/2016 අනුව
     I වසර - රු. 27,140
     II වසර - රු. 27,440
   - වැටුප් පරිමාණය ඃ MN 03 රා.ප.ච. අංක 03/2016 අනුව
     රු. 31,040-10×445-11×660-10×730-10×750-රු. 57,550/-

2. *සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි ඃ*
   i. පළමුව පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර පුහුණු කාලය දෙවසරකි.

   ii. වසර 02ක පුහුණුව අවසානයේ පවත්වනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ - 6) මට්ටම විභාගයෙන් සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ අඩවිවන නිලධාරි තනතුරට පත් කරනු ලැබේ.

   iii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.



   iv. පත්වීම අවු 03ක පරිවාස කාලයකට යටත් වේ.

   v. අඩවි වන නිලධාරින්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි, දුෂ්කර සේවා ස්ථාන වන අතර තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

   vi. ශ්‍රී ලංකා තාක්ෂණ සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සහ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ අඩවි වන නිලධාරි සහ වන පාලක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ වගන්ති අදාළ වනු ඇත.

   vii. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3. *වයස් සීමාව* - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

4. *අධ්‍යාපන සුදුසුකම්* - සෑම අයදුම්කරුවකුම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

   i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව සහිතව විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

   හෝ

   පැරණි විෂයය නිර්දේශය යටතේ සත්ත්ව විද්‍යාව, උද්භිත විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව අ.පො.ස. (උ.පෙළ) විභාග යෙන් විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.

   සහ

   ii. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්ව තිබීම.

5. *වෙනත් සුදුසුකම්*

   i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

   ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

   iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 3හි සහ 4හි සඳහන් සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

   iv. මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

   v. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

6. *බඳවා ගැනීමේ ක්‍රමය*

   i. ඉහත 3, 4 හා 5 ඡේදයන් යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්, ලිඛිත පරීක්ෂණයකින් ලබා ගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, විභාගයේදී ලබා ගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවේ අනුපිළිවෙළ මත, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

   ii. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියලු දෙනා වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා හෝ සිදු කෙරෙනු ඇත.

   iii. ඉහත 6.1 ඡේදයේ සඳහන් පරිදි බඳවාගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේදී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනකු සිටියහොත් එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගනු ලැබේ.

   iv. ඉහත 6.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ පවත්වනු ලබන වසර 02ක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට ජාතික වෘත්තීය කුසලතාවෙහි 6 වන මට්ටම (N'V'Q.-6) විභාගය සමත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට ඇතුළත් කෙරේ.

7. *විෂයය නිර්දේශය*

   ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් යුක්තය.

| ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය<br>කාලය පැය 01<br>ලකුණු සංඛ්‍යාව 100 | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවත්, විශ්ලේෂණ තත්ත්වයන්, තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය<br>කාලය පැය 02<br>ලකුණු සංඛ්‍යාව 100 | මෙම ප්‍රශ්න පත්‍රය, වන සම්පත හා එය ජීවීන්ගේ පැවැත්ම සඳහා බලපානු ලබන ආකාර පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ පාරිසරික දැනුවත් බව, භූගෝලීය වැදගත්කම පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය පිළිබඳ වූ දැනුම වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වැදගත් තොරතුරු, එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය, ස්වභාවික පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම, වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාව පිළිබඳ වැදගත්කමේ අවබෝධය, භූගෝලීය විද්‍යාවේ මූලික අවබෝධය (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ) ආදිය හා අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම පිළිබඳ මැන බැලීම සඳහා වන ව්‍යුහගත හා අර්ධ ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. |



අපේක්ෂකයින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකට ම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු ප්‍රමාණය 40% වත් ලබා ගත යුතුය.

9. *විභාග ගාස්තු ඃ*

   ❖ විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

   i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
   ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
   iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
   iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

   *සටහන* :-
   (අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.
   (ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් ( SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන්